පුනරුච්චාරණය කරන්නාක් මෙනි.

දාහතරේ මහත්තයා

'මම පුංචිම කාලේ හිටියේ තලංගම. මගේ තාත්තා බත්තරමුල්ල, කොස්වත්තේ හිටිය නොතාරිස් කෙනෙක්. නම එල්.එම්.පී. ජයවර්ධන. මිනිස්සු 'එල්' අකුර ළඟට 'ඒ' අකුරක් දාලා 'ලෑම්ප්, ලාම්පු ජයවර්ධන' කියලා තමයි තාත්ත ට කියලා තියෙන්නේ. තාත්තට ප්‍රයිවට් බස් කොම්පැණියකුත් තිබුණා. ඒ බස්වල තමයි මම තාලන්දට ඉස්කෝලේ ගියේ. තාත්ත දවසකට මට ශත පනහක් දෙනවා වියදමට. තලංගම ඉඳලා බොරැල්ලට බස් එකට ශත පහළොවයි. හැබැයි මම බස් එකට දුන්නේ ශත දාහතරයි. ඉතුරු ශතේ තියාගන්නවා කඩල කන්න. ඒ නිසා බස්වල කොන්දොස්තරලා මට හමක් දාලා තිබුණා 'දාහතරේ මහත්තයා' කියලා. කොහොම හරි මේ වැඩේ තාත්තට ආරංචිවෙලා දවසක් මගෙන් ඇහුවා ඇයි එහෙම කරන්නේ කියලා. මම කිව්වා ඔය තව මොනව හරි යාලුවන්ට එහෙම අරගෙන දෙන්න කියලා. ඒ වුණාට තාත්ත දෙන ශත පනහ නම් වැඩි කරේ නෑ'

මුලින්ම දකුණු තලංගම සිංහල විද්‍යාලයට ඇතුළත්ව අකුරු කළ ජේ.එච්. පස්වන ශ්‍රේණිය සමත් වුවාට පසු කොළඹ නාලන්ද විද්‍යාලයට ඇතුළත් කෙරුණාද වැඩි කලක් නාලන්දේ අධ්‍යාපනයට ඔහුට වරම් නොලැබෙන්නේ සිය පියාගේ ව්‍යාපාරික කටයුතු බිඳ වැටී බස් පමණක් නොව ගේ දොර ඉඩ කඩමිඳ විකුණා, ගමත් හැර යන්නට වීම හේතුවෙනි.

'බංකොලොත් වුණාට පස්සේ තාත්තා තිබුණ හැමදේපොළක්ම විකිණුවා. ඒවා ගත්තේ ඒ කාලේ හිටපු ප්‍රසිද්ධ ක්‍රිකට්කාරයෙක්. මහේෂ් රොඩිගු කියලා. ඉඩම් විකුණලා ණය ගෙව්වා. ඉතිරි වුණ සල්ලි ටිකෙන් කුරුණෑගල පොල්අත්තපිටියෙන් ඉඩමක් අරගෙන අපි ඔක්කොම එහෙ පදිංචියට ගියා. ඒ කාලේ නොතාරිස්ලට කුරුණෑගල රත්තරං ආකාරයක් කියලා තමයි ප්‍රසිද්ධවෙලා තිබුණේ. ඒ තරම් සැරේට ඉඩම් ඔප්පු ලියවිල්ල එහෙ තිබ්බලා තියනවා. කුරුණෑගල ගිහින් ටික කාලයක් යනකොට ආයෙත් තාත්තගේ අතමිට සරුවෙන්ඩ පටන්ගත්තා. තාත්ත ආයෙත් ඉඩම් අරගෙන ගෙවල් හදලා. කාර් දෙකක් ගත්තා. මොරිස් එකකුයි හිල්මන් එකකුයි.'

එතැන් සිට ජේ.එච්.ගේ ජීවිත කතාව ලියැවෙන්නේ කුරුණෑගල පසුබිම් කරගෙනය. කුරුණෑගල මළියදේව විද්‍යාලයේ ඉගෙනුම ලබන ජේ.එච්. ඉන් පිටවෙන්නේ ලන්ඩන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබමිනි.

'මම ඉස්කෝලේ යන කාලෙම තාත්තා නැතිවුණා. තාත්තා ඉන්න කාලේ හිතරම කියලා තිබුණා මාව ලන්ඩන් යවලා උගන්තන්න ඕනේ කියලා. ඒ නිසා මළියදේවෙන් අස්වුණාට පස්සේ අම්මා ළැස්තිවුණා මාව ලන්ඩන් යවන්ඩ. මම කිව්වා මට බෑ පිටරටවල යන්ඩ කියලා. පස්සේ මම සැනිටරි ඉන්ස්පෙක්ටර් විභාගයට ලියලා පාස්වුණා. මට පත්වීම ලැබුණේ රත්නපුරේට. මම පුංචි සයිකලේකින් තමයි වැඩට යන්නේ. ඒ කාලේ මිනිස්සු මට 'කුණා' කියලා නමක් දාලා තිබුණා. මොකද මගේ වැඩේ කුණු ගැහ ගොයන එක නිසා කියලා. ටික කාලෙකින් මට මේ රස්සාව එපා වෙලා ආණ්ඩුවේ ලිපිකාර විභාගෙට ලිව්වා. ඒක පාස්වෙලා මුලින්ම කොළඹ විදුලි දෙපාර්තමේන්තුවට පත්වීම ලැබුණා.'

ජේ.එච්. ගේ ජීවිතයේ අනන්‍යතා ප්‍රකට වන්නට පටන්ගන්නේ ලිපිකරුවකු ලෙස රැකියාව කරන්නට පටන්ගැනීමෙන් පසුවය. එවක සිදුවූ ඇතැම් හාස්‍ය ජනක සිදුවීම් අදත් ඔහු සිහිපත් කරන්නේ හාස්‍ය ජනක ලෙසිනි.

'කොටුව, කොල්ලුපිටිය, මරදාන අනුවෙන ලෙජර් 17 විදුලි බිල් ගෙවීම් බලලා බිල් නොගෙවන අයගේ ලයිට් කපන්න නියෝග කරන එක තමයි මුලින්ම මට පැවරුණ රාජකාරිය. වහාම ගිහ මුදල් ගෙවන්න කියලා ලියුම් යවලා නොගෙව්වොත් ලයිට් කපන්න දානවා. මම ලෙජර් එක අරගෙන බිල් ගෙවලා නැති හැම කෙනෙකුටම ලියුම් යැව්වා, බිල් නොගෙව්වොත් ලයිට් කපනවා කියලා. මෙන්න පහුවදා එක එක කාර් ඇවිත් ඔෆිස් එක ඉස්සරහා නවත්තනවා. ඒවයින් බැහැලා එන මිනිස්සු එකවුන්ටත් හොයාගෙන ගිහිල්ලා හොදටම බනිනවා. ටැලිපෝන්වලිනුත් බැනුම්. පස්සේ එකවුන්ටත් මට එන්න කියලා ඇහුවා තමුසේ කාටද මේ ලියුම් යවලා තියෙන්නේ? හමුදාපතිටත් ලයිට් කපනවා කියලා ලියුම්යවලානේ. මින් පස්සේ බිල් නොගෙව්වා කියලා එහෙම හැමෝටම ලියුම් යවන්න එපා. යවන්න ඉස්සෙල්ලා මගෙන් ඉතනවා කියලා. බලනකොට, ලෙජර් එක බලලා, මම ඒ කාලේ දෙවනි ලෝක යුද්දේ ශ්‍රී ලංකාවේ අණදෙන ප්‍රධානියාටත් ලියුමක් යවලා. මිනිහ ටැලිපෝන් එකෙන්ම එකවුන්ටත් කුණුහරුපෙන් බැනලා. සර් ජෙරාඩ් විජේකෝන් කියලා නයිට්වරයෙක් හිටියා. එයාටත් ලියුමක් යවලා.'

ජේ.එච්. කලා ලෝකයට පිවිසෙන්නේ මෙලෙස කොළඹ විදුලි දෙපාර්තමේන්තුවේ රැකියාව කරමින් සිටියදීය. ඒ අවස්ථාව ඔහුට හිමිවන්නේ ඔහු සමග එකට වැඩකළ පී වැලිකලගෙනි.

'ඒ කාලේ ඉදලාම වැලිකල ගුවන් විදුලියට නාට්‍ය ලියනවා. පස්සේ මෙයා විදුලි දෙපාර්ථමේන්තුවේ අයින් වෙලා ගුවන් විදුලියේම රැකියාවකට ගියා. මටත් කතා කළා නාට්‍ය කරන්න එන්න කියලා. මමත් ගියා. මුලින්ම හඬ කැවීම් ශිල්පියෙක් විදිහට සම්බන්ධ වුණා. පස්සේ නාට්‍ය ඇංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුකුත් ලැබුණා. ඒ වුණාට ඒ රස්සාවේ මම වැඩි කාලයක් හිටියේ නෑ. ගෙවීම් මදි නිසා ආපහු ලිපිකරු රැකියාවට අනුයුක්ත වුණා. රස්සාව කරන අතරේ ගුවන් විදුලි නාට්‍ය කළා. වෙනත් වැඩසටහන් කළා. ඒවට වෙනම ගෙවීම් කෙරුණ නිසා මට පඩියට අමතරව මුදලක් අතට එන්න පටන් ගත්තා.'

ජේ.එච්. ගුවන් විදුලි නාට්‍ය තුළ අත්කරගත් ජනප්‍රියත්වය කොතෙක්ද යත් දිනක් ගුවන්විදුලියේ එවක ප්‍රධානී එම්.ජේ. පෙරේරා තමන්ව සිය නිවෙසට කැඳවාගෙන ගිය බවත්, ඔහුගේ දරුවන්ගේ ඉල්ලීම පරිදි එහිදී 'සාජන්ටි පෙරේරාගේ විකුම' නම් වූ එවක ජනප්‍රිය ගුවන්වදුලි රහස් පරීක්ෂක නාට්‍යයේ සාජන්ටිගේ චරිතය නිරූපනය කිරීමට සිදුවූ බවත් ජේ.එච්. පවසයි.

මෙලෙස කොළඹ බෝඩිම් වී ලිපිකරු රැකියාවේ නිරතව, ගුවන් විදුලියටද සම්බන්ධව කටයුතු කරමින් සිටි ජේ.එච්. නැවත කුරුණෑගල යන්නේ කුරුණෑගල කච්චේරියේ ගම්මුලදෑනි පාලන ඇංශයේ දෙවැනියා ලෙසට සේවා අනුයුක්තියක් ලබමිනි.

'ඒ සෙක්ෂන් එකෙන් ගම්මුලදෑනි 423 ක් පාලනය වුණා. ගම්මුලදෑනියාට ඒ කාලේ කිව්වේ හෙඩ්මන් කියලා. මිනිහා තමයි ගමට ඉන්න පොලිස්කාරයා. ඒ කාලේ අද වගේ හැම තැනම පොලිසි තිබුණේ නෑ. ලොකු ටවුන්වල විතරයි පොලිසි තිබුණේ. ගමේ පොලිස් බලතල ක්‍රියාත්මක කළේ හෙඩ් මන්. ඔය සෙක්ෂන් එකේ ප්‍රධානියාගේ සහායකයා විදිහට මම වැඩ කළා. ගම්මුලදෑනි කච්චේරියට ආවම මම හොදට කතා බහ කරලා සැලකන නිසා ඒ මිනිස්සු බොහොම සතුටු වුණා. මාළිය පැත්තේ රොඩ් හෙඩ්මන් කෙනෙක් හිටියා මට මතකයි. මිනිහා ආවමත් මම අනිත් අයට වගේම ඉඳගන්න පුටුවක් එහෙම දීලා තමයි කතා කරන්නේ. කුරුණෑගල පැත්තේ ඉන්නේ උඩරට මිනිස්සුනේ. ඒ මිනිස්සු හරියට කුල හේදය සලකනවා. කච්චේරියේ අනික් අයට මගේ මේ වැඩපිළිළෙ ඇළුලුවේ නෑ. ඒ අය මේකට මට චෝදනා කළා. මමත් පාතරට මිනිහනේ. ඒ වුණාට මම මගේ පිළිවෙළ වෙනස් කළේ නෑ.' එසේ වුවද මේ හේතුවෙන් ජේ.එච්.ට කුරුණෑගල කච්චේරියේ රැකියාවෙන් වෙනත් ස්ථානයකට මාරුවක් ලැබුණේය. ජේ.එච්.ගේ විවාහය සිදුවෙන්නේ මේ කාල වකවානුවේදීය.

හෙඩ්මන්ලගේ ගෙවල්වල විනෝදේ

'කුරුණෑගල කච්චේරියේ වැඩකරන කාලේ මම මෝටර් සයිකලයක් ගත්තා. නිවාඩු දවස්වල ඕකෙන් විනෝද ගමන් යන්න පුරුදු වුණා. ගම්වල හෙඩ්මන්ල අඳුනන නිසා ඒවාට ගියාම ඒ මිනිස්සු හොඳට සළකනවා. කන්න බොන්න දෙනවා. ටික කාලයක් යනකොට මම පුරුදු වුණා සති අන්තයේ දුර පළාත්වල ගම්වලට ගිහිල්ලා හෙඩ්මන්ලගේ ගෙවල්වල ගතකරලා එන්න. මේක අපේ අම්මට ඇළුලුවේ නෑ. අම්ම කිව්වා පුතේ දැන් උඹ කසාදයක් කරගන්න ඕනේ කියලා. කපුවන්ට කියලා යෝජනා ගේන්න පටන් ගත්තා. ඒ කාලේ කපුවෝ ගෙදරට එනවා ගෑණු ළමයි පස් හය දෙනෙකුගේ පොටෝ සාක්කුවේ දාගෙන. මෙයා කොහොමද? මෙයා කොහොමද? කියා කියා පොටෝ පෙන්නලා තමයි මුලින්ම කැමැත්ත ඉතන්නේ, ඔහොම යනකොට දවසක් එක පොටෝ එකකට මගේ හිත ගියා. එයා කදානේ ළමයෙක්.'

ජේ.එච්. කදානේ නොතාරිස් රාලහාමි කෙනෙකුගේ දියණියක වූ ස්වර්ණා සුමේධා හා අතිනත ගන්නේ ඒ යෝජනාවේ ප්‍රතිපලයක් ලෙසිනි. පසුව කදානේම පදිංචිවන මේ යුවළ දුවක සහ පුතෙකු ලබන්නාහ. අද වන විට ඒ දුවත් පුතාත් දෙදෙනාම විවාහ වී දරුවන් ලැබ වෙනම ජීවත් වන්නේය. ජේ.එච්. එදා තෝරාගත් ජායාරූපයේ ජීවමාන රුව කාලය විසින් වෙනස් කරනු ලැබ තිබුණද, එදා දෙදෙනා අතර බැඳි සෙනෙහස වෙසකට ලක්කරන්නට කාලයට හෝ වෙනත් කිසියම් හෝ දෙයකට පුලුවන් කමක් ලැබී නැත. මනාලිය බලන්නට ගිය දවසේ මතකයද ඔහු අවදි කරන්නේ සිනාසෙමිනි.

'මනමාලි ඇවිල්ලා මට මුලත් තට්ටුව දීලා මොකවත් කතා කරන්නේවත් නැතුව යන්ඩ ගියා. ඒ කාලේ අදහසක් තිබුණා මනමාලියක් බලන්න ගියාම කොහොම හරි ගෙයි පිළිකන්න පැත්තට ගිහින් ඒ පැත්ත බලන්න. ඒකෙන් තමයි මනමාලිගේ ගෙදර නියම තත්ත්වෙ තේරෙන්නේ කියලා. ඒක නිසා මමත් මූත්‍රා බරක් කියලා ගෙයි පිළිකන්න පැත්තට ගියා. දැන් වගේ ඒ කාලේ ගෙවල් ඇතුළේ වැසිකිළි තිබුණේ නෑ. ගෙයක් ඇතුලේ වැසිකිළියක් තියනවා නම් ඒක මහම මහ මුසළකමක් කියලා තමයි එදා සැළකුවේ. කොහොම හරි ඔන්න බැලුවම පිළිකන්න පැත්ත බොහොම හොදට තියනවා. හැබැයි මට දැන් සැකයක් මනමාලි ගොලුවෙක්ද? නැත්නම් ගොතයක්වත් තියන කෙනෙක්ද කියලා. මම ගෙට එනකොට දැක්කා මගේ අක්කත් එක්ක මනමාලි මොනවද කුටු කුටුගාගව. හැබැයි සද්දයක් පිටවෙන්නේ නෑ. මම පස්සේ අක්කගෙන් ඇහුවා අක්කේ මොකද මනමාලිට කතා කරන්ඩ බැරිකමක් මොකවත් තියනවද කියලා. එහෙම තමයි මල්ලි මනමාලියෝ මුලින්ම කතා කරනකොට සද්දේ ඇහෙන්නේ නෑ. බැඳලා ටික කාලයක් යනකොට තමයි වොලියුම් එක වැඩි වෙන්නේ කියලා.'

ජේ.එච්. සුමේධා අතිනත ගන්නේ 1949 දීය. මේ විවාහයට තිබුණු බාධකයක් තමන් විසින් ඉවත් කරන ලද අපූර්ව ආකාරය ජේ.එච්. විස්තර කළේ මෙසේය.

'පොඩි කාලේ මගේ කේන්දරේ බලලා අනාගතේ ගැන ලියලා දීලා තිබුණ විස්තරය හරියටම හරි ගියා. කියලා තිබුණ හැමදේම ඒ විදිහට ඒ කාලවල සිද්ධ වුණා. මගේ පළවෙනි විවාහයේ බිරිය මැරෙනවා දෙවනි විවාහක් සිද්ධවෙනවා කියලත් ඒකේ තිබුණා. ඒ නිසා කසාදේ තීන්දු වුණත් මගේ හිතට මහ දුකක් දැණුනා. මම කේන්දර පොත හොයාගෙන කසාදේ ගැන විස්තර තිබුණ කොළේ කඩලා ඉරලා විසිකළා. කේන්දරේ තිබුණ හැම දෙයක්ම හරි ගියත් කසාදේ ගැන තිබුණ ඒ අනාවැකිය නම් හරිගියේ නෑ.'

කලාකරුවකු ලෙස සිය අනන්‍යතාව ගොඩනැගුණු ආකාරය ජේ.එච්. විස්තර කරන්නේ මෙලෙසිනි.

'ගුවන් විදුලි නාට්‍ය කරන අතරේ වැලිකල මාව වේදිකා නාට්‍යවලටත් ගෙනාව. මුලින්ම රගපෑම.



පස්සේ මම තනියමත් නාට්‍ය කළා. රගපෑමට යොමුවුණාමත් මට මුලින්ම ගුරුහරුකම් දුන්නේ වැලිකල. පස්සේ මම ඒ විෂය ගැන ඉංග්‍රීසියෙන් තිබුණ පොත් හොයාගෙන කියවන්ඩ පටන් ගත්තා. ඒ ඇර වෙන ක්‍රමයක් තිබුණේ නෑ ඒවා ඉගෙන ගන්න. ඒ පොත් කියවලා ස්වයං අභ්‍යාස කරලා තමයි චරිතයක් සාර්ථකව කරන්න ඉගෙන ගත්තේ. පස්සේ චිත්‍රපටිවලත් චරිත ලැබුණා'

11 වන පිටට

Dhammika Kulatunga
Ph : 03 9308 1647
Mob : 0411 272 162
DD
REFRIGERATION
☆ Installation, repairs & maintenance of Split type air conditioning
☆ Repairs of domestic & commercial refrigerators freezers and cool rooms
☆ Repairs of Electrical Appliences
Fully licensed for air conditioning plumbing